**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/05/04/06/03 -11
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2018.03 . 13

**චක්‍රලේඛ අංක 12/2018**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත් විෂය සම්බන්ධීකරණ නිලධාරීන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප විෂය සම්බන්ධීකරණ නිලධාරීන්,
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,
සියලු ම දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) ගුරු උපදේශකවරුන්,

Information and Communication Technology Branch
Ministry of Education

**පාසල් , කලාප , පළාත් හා සමස්ත ලංකා මට්ටමේ දෙවන ජාතික භාෂා (සිංහල /දෙමළ) වාර්ෂික තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛය සංශෝධනය**

අධ්‍යාපන ලේකම්ගේ අංක 2006/37(1) හා 2013.01.02 දිනැති දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) චක්‍රලේඛය 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි.ඒ අනුව පාසල් මට්ටමේ දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරගාවලිය මෙම චක්‍රලේඛ විධිවිධාන සමගින් ඊට අමුණා එවා ඇති උපදෙස් සංග්‍රහය අනුව පැවැත්විය යුතු වේ.

2018 වර්ෂයේ සිට මෙම චක්‍රලේඛ උපදෙස් අනුව පළාත්, කලාප හා පාසල් මට්ටම නිසි පරිදි දැනුවත් කරමින් වඩාත් ප්‍රශස්ත අයුරින් වාර්ෂික ව මෙම තරගාවලිය ඒ ඒ මට්ටම්වලින් පැවැත්වීමටත් ඉන් අනතුරුව සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රාහක සිසු සිසුවියන් තෝරා ගැනීමටත් කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

සමස්ත ලංකා මට්ටම සඳහා ජයග්‍රාහී සිසුන් ඉදිරිපත් කිරීමේ දී චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය භාවිතා කරමින් අංග සම්පූර්ණ ව සැකසූ නිවැරිදි නිල ප්‍රතිඵල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු බවත් ඒ අනුව සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සමස්ත ලංකා මට්ටමට නම් කිරීම පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් බව කාරුණිකව සටහන් කර ගන්න.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# <u>සමස්ත ලංකා දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) වාර්ෂික තරඟාවලිය</u>

## 1.0. හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ දෙවන ජාතික භාෂා ඒකකය මඟින් රජයේ පාසල්වල 6 – 9 ශ්‍රේණිවල සියලුම සිසුන් සඳහා මෙම තරඟාවලිය වාර්ෂික ව පැවැත්වේ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූල ව සාමාන්‍ය දැනුම වර්ධනය කිරීම, නිර්මාණාත්මක කුසලතා හා දෙවන ජාතික භාෂා හැකියාව සංවර්ධනය කිරීම මෙම තරඟාවලියේ අරමුණ වේ.

මෙම තරඟ සඳහා ඉදිරිපත් විය හැක්කේ 6 – 9 ශ්‍රේණිවල සිංහල මාධ්‍ය පාසල්වල සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන් සඳහා දෙවන ජාතික භාෂාව දෙමළ ද, දෙමළ මාධ්‍ය පාසල්වල දෙමළ මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන් සඳහා දෙවන ජාතික භාෂාව සිංහල වශයෙන් ඉගෙන ගන්නා සිසුන්ට ය.

1.1. මෙම තරඟය තරඟ මට්ටම් 4කින් පැවැත්වේ.

1) පාසල් මට්ටම
2) කලාප මට්ටම
3) පළාත් මට්ටම
4) සමස්ත ලංකා මට්ටම

1.2. මෙතෙක් පවත්වන ලද දෙවන ජාතික භාෂා දෙමළ තරඟවල දී සිංහල මාධ්‍ය සිසුන්ගේ සාපේක්ෂ වශයෙන් සහභාගීත්වය අඩු මට්ටමක පැවති නිසා ඒ සඳහා උනන්දුව වර්ධනය කිරීම පිණිස, මව්භාෂාව දෙමළ වූ සිසුන්ට මෙම අවස්ථාව ලබා දිය යුතු බැවිනුත් මෙම තරඟය පළාත් මට්ටම තෙක් කොටස් දෙකක් වශයෙන් පැවැත්වීමට තීරණය කර ඇත.

1.3. පද්‍ය ගායනා තරඟ හැර අනෙකුත් තරඟ සඳහා පමණක් පහත සඳහන් කොන්දේසි අදාළ වේ.

1) සිංහල මාධ්‍ය පාසල්වල මව්බස සිංහල වන සිසුන් සඳහාත් (සිංහල සිසුන්)
2) සිංහල මාධ්‍ය පාසල්වල මව්බස දෙමළ වන සිසුන් සඳහාත් (මුස්ලිම් හා දෙමළ සිසුන්)

දෙවන ජාතික භාෂාව දෙමළ යටතේ තරඟ කළ හැකි ය. මෙම තරඟයේ දී ඉහත සඳහන් කොටස් දෙකට අයත් සිසුන් සඳහා තරඟය වෙන වෙන ම පවත්වා ප්‍රථම ස්ථානය ලබා ගන්නා සිසුන් දෙදෙනා පමණක් කලාප , පළාත් හා සමස්ත ලංකා මට්ටමේ තරඟවලට ඉදිරිපත් කළ යුතු වේ.

එසේ වුවද සමස්ත ලංකා මට්ටමේ තරඟයේදී ඉහත කොටස් (1) සහ (2) යන සියලු සිසුන් සඳහා පොදු තරඟයක් ලෙස පවත්වා ප්‍රතිඵල ද පොදු වේ නිකුත් කළ යුතු වේ.

## 2.0. පොදු අරමුණු

01. ජාතීන් අතර අවබෝධතාව හා මූලික සන්නිවේදන හැකියාව වර්ධනය කිරීම.

02. ජාතික ඒකාබද්ධතාවය වර්ධනය හා ජාතීන් අතර සංස්කෘතික සහජීවනය ප්‍රවර්ධනය කිරීම.

03. දෙවන ජාතික භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් කිරීම හා වර්ධනය කිරීම.

04. දෙවන ජාතික භාෂාව හා චතුර්විධ භාෂා කුසලතා ඇගයීමට ලක් කිරීම හා වර්ධනය කිරීම.

05. දෙවන ජාතික භාෂාවේ ඉගෙනුම් - ඉගැන්වීම පිළිබඳ ප්‍රබෝධයක් ඇති කිරීම

06. දෙවන ජාතික භාෂාව සම්බන්ධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සජීවී අත්දැකීම් ලබන අවස්ථාවක් බවට පත්කිරීම.

07. වත්මන් ලෝක ගැටලු දෙස මානව දයාවෙන් යුතු ව බැලීමේ හැකියාව ඇති සංවේදී පුද්ගලයන් සමාජයට දායාද කිරීම.

## 3.0. මූලික උපදෙස්

කාල රාමුව හා තරග පැවැත්වීමේ වගකීම

| තරග මට්ටම | තරග මෙහෙයවීම හා සහභාගිත්වය | තරග පවත්වා අවසන් කළ යුතු දිනය | ප්‍රතිඵල සටහන භාර දිය යුතු අවසන් දිනය හා විස්තර |
|---|---|---|---|
| පාසල් | 1. විදුහල්පති<br>2. දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුව<br>3 .පාසලේ 6 -9 ශ්‍රේණිවල සිසුන් | මැයි 15 | ඒ ඒ තරගයෙන් තෝරා ගත් සිසුන් දෙදෙනා පමණක් ඇතුළත් කොට අදාළ ආකෘතිය අනුව සැකසූ නිල ප්‍රතිඵල මැයි 31 දිනට පෙර (ආකෘතිය අමුණා ඇත) තම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතුය. |
| කලාප | 1.කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ දෙවන ජාතික භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරී /දෙවන ජාතික භාෂා විෂය සංවර්ධන කමිටුව<br>2.පාසල් තරගාවලියෙන් තෝරා ගත් සිසුන් | ජූලි 30 | ඒ ඒ තරගයෙන් තෝරා ගත් සිසුන්ගේ නම් ඇතුළත් කොට අගෝස්තු 15 දිනට පෙර මෙහි දක්වා ඇති ආකෘතියට අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය. |
| පළාත් | 1.පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් දෙවන ජාතික භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරී /පළාත් දෙවන ජාතික භාෂා විෂය සංවර්ධන කමිටුව<br>2.කලාප තරගාවලියෙන් තෝරා ගත් සිසුන් | සැප්.15 | ඒ ඒ තරගයෙන් 1 හා 2 ස්ථාන ලැබූ සිසුන්ගේ නම් පමණක් ඇතුළත් කොට මෙහි දක්වා ඇති නිල ප්‍රතිඵල ආකෘතිය අනුව සකස් කොට සැප්.30 දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව,ඉසුරුපාය,බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. |
| සමස්ත ලංකා මට්ටම | 1. අධ්‍යාපන අධ්‍යක්ෂ/ නි.අ.අ. (දෙවන ජාතික භාෂා)<br>2. පළාත් තරගාවලියෙන් ජයග්‍රහණය ලත් සිසුන් | නොවැ.15 | දෙසැම්බර් 31ට පෙර ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම උත්සවාකාරයෙන් සිදු කෙරේ. |

### 3.1. පාසල් මට්ටම (මැයි මස 15ට පෙර)

මෙම තරගාවලියේ අරමුණු ඉටුවන පරිදි ප්‍රශස්ත අයුරින් පාසල් මට්ටමේ තරගාවලිය සඳහා 6 – 9 ශ්‍රේණිවල සියලු ම සිසුන් සහභාගීකරවීම අනිවාර්යය අවශ්‍යතාවයක් වේ. පාසල් මට්ටමේ ප්‍රථම , දෙවන , හා තෙවන ස්ථාන ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා දිනයක් වෙන් කිරීම විදුහල්පති හා දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවේ වගකීම වේ.

### 3. 2. කලාප මට්ටම (ජූලි 30ට පෙර)

පාසල් මට්ටමේ තරගාවලිය පවත්වා එහි ප්‍රතිඵල මත ප්‍රථම හා දෙවන ස්ථාන දිනා ගන්නා දරුවන් පමණක් කලාප මට්ටමේ තරග සඳහා සහභාගී කරවිය යුතුය. මෙහි දී මෙම චක්‍ර ලේඛයේ 1.3 වගන්තිය ප්‍රකාර ව ක්‍රියා කළ යුතුය. මෙහිදී කලාප මට්ටමින් දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතු ය. එහි සභාපති ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ද, ලේකම් ලෙස විෂය සම්බන්ධීකරණ නිලධාරියා ද, කමිටු සාමාජිකයන් වශයෙන් වෙනත් භාෂා හා සෞන්දර්ය විෂය සම්බන්ධීකරණ නිලධාරීන් තිදෙනෙකු ද ඇතුළත් විය යුතු ය. කලාප මට්ටමේ ලිඛිත තරගය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමට පෙර වර්ෂවලදී ලබා දී ඇති ප්‍රශ්න පත්‍රය ආදර්ශයට ගනිමින් ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීම කලාපයේ දෙවන බස විෂය සම්බන්ධීකරණ නිලධාරියා විසින් කළ යුතු වේ.එමෙන්ම පාසල් මට්ටමේ තරගාවලිය අධීක්ෂණය කිරීමද කලාප මට්ටමෙන් සිදු කළ යුතුය.

### 3. 3. පළාත් මට්ටම (සැප්තැම්බර් 15ට පෙර)

කලාප තරඟාවලිය පවත්වා එහි ප්‍රතිඵල මත ප්‍රථම හා දෙවන ස්ථාන දිනාගන්නා දරුවන් පමණක් පළාත් මට්ටමේ තරඟ සඳහා සහභාගී කර ගත යුතු ය. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සෑම පළාතක ම දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතු ය. එහි සභාපති ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ද, ලේකම් ලෙස දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරියා ද, කමිටු සාමාජිකයන් වශයෙන් වෙනත් කලාපවල දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් ද ඇතුළත් විය යුතු ය. මේ පිළිබඳ ව සැලසුම් කිරීම හා පාසල් මට්ටමේ සිට කලාප මට්ටමේ තරඟාවලිය සඳහා උපදෙස් හා මඟ පෙන්වීම පළාත් දෙවන ජාතික භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරියා විසින් කළ යුතු අතර සියලු ම මට්ටමේ අධීක්ෂණ කටයුතු සඳහා ද සහභාගී විය යුතුය.

පළාත් මට්ටමේ ලිඛිත තරඟ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් වෙත ලබාදෙනු ලබන ප්‍රශ්න පත්‍ර හා කාල සටහනකට අනුව සියලු ම පළාත්වල එක් දිනයක දී එකම වේලාවක දී පැවැත්විය යුතුය.

### 3. 4. සමස්ත ලංකා මට්ටම (නොවැම්බර් 30ට පෙර)

පළාත් මට්ටමේ ප්‍රතිඵල මත චක්‍රලේඛයේ 1.3 වගන්තිය අනුව තෝරා ගත් සිසුන් සඳහා සමස්ත ලංකා තරඟාවලිය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පවත්වනු ලැබේ. සමස්ත ලංකා මට්ටමේ පද්‍ය ගායනා තරඟ පොදු තරඟයක් ලෙස පැවැත්වේ. සැප්.30 දිනට පෙර සියලු ම පළාත්වලින් නිල ප්‍රතිඵල ලේඛන අදාල ආකෘතියට අනුව සකස්කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව වෙත එවිය යුතු ය.

### 3.5. තරඟ ඉසව්

මෙම තරඟාවලියට අදාළ තරඟ ඉසව්, තරඟ පැවැත්විය යුතු ශ්‍රේණි, සහ ඉසව් සංඛ්‍යාව පහත සඳහන් වගුවෙන් දැක්වේ

| අනු අංකය | ඇගයීම් වර්ගය | ශ්‍රේණිය හා තරඟ සංඛ්‍යාව | | | | මුළු තරඟ ගණන |
|---|---|---|---|---|---|---|
| | | 06 | 07 | 08 | 09 | |
| 01 | භාෂා භාවිතය හා අවබෝධය | 01 | 01 | 01 | 01 | 04 |
| 02 | කියවීම | 01 | 01 | 01 | 01 | 04 |
| 03 | කථික | 01 | 01 | 01 | 01 | 04 |
| | මුළු තරඟ ගණන | 03 | 03 | 03 | 03 | 12 |
| 04 | පද්‍ය ගායනා (කණ්ඩායම් තරඟ ) | 01 | | | | 01 |
| | මුළු තරඟ ගණන එක් මාධ්‍යක් සඳහා | 03+03+03+03+01 | | | | 13 |

(මෙහිදී දෙවන ජාතික භාෂාව (දෙමළ) දෙවන ජාතික භාෂාව (සිංහල) වශයෙන් තරඟ 26ක් පැවැත්වෙන බව සැලැකිය යුතුය)

එක් වර්ෂයකදී එක් තරඟකරුවෙකුට සහභාගී විය හැක්කේ එක් තරඟයකට පමණි. නමුත් ඊළඟ වර්ෂයේ දී ඔහුට හෝ ඇයට පෙර වර්ෂයකදී සහභාගී වූ තරඟය හැර වෙනත් තරඟයක් සඳහා ඉදිරිපත් විය හැකි ය. කවර මට්ටමක දී වුව ද දී ඇති තරඟ නීති උල්ලංඝණය වීමක් සිදුවුවහොත් තරඟයෙන් ඉවත් කිරීමට සිදු වේ.

සෑම තරඟයක්ම ආරම්භයට පෙර මෙහි පහත සඳහන් අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කර දිය යුතුය. තරඟ සඳහා ඉදිරිපත්වීමේ දී නිවැරදි නම, ලිපිනය, ශ්‍රේණිය, ඉගෙන ගන්නා මාධ්‍ය තරඟයට ඉදිරිපත් වන මාධ්‍ය (උදා- සිංහල මාධ්‍ය දෙවන ජාතික භාෂාව දෙමළ ලෙස සැලකිය යුතුය) කලාපය හා පළාත අනිවාර්යෙන් ම සඳහන් කළ යුතු ය. (මෙම විස්තර තමන්ගේ මව්බසින් ලිවිය හැකි ය.) තරඟ කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා විධිමත් ඡායාරූපයක් සහිත අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. (නිදසුන් තැපැල් හැඳුනුම්පත)

මෙම තරඟාවලියේදී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

## <u>4.0. කොන්දේසි හා ලකුණු ක්‍රමය</u>

### <u>4.1. භාෂා භාවිතය හා අවබෝධය - ලිඛිත පරීක්ෂණය</u>

#### 4.1.1. අභිමතාර්ථ

අකුරු, වචන, වාක්‍ය හා පින්තූර නිවැරදි ව හඳුනා ගැනීමේ කුසලතා වර්ධනය හා දෙවන ජාතික භාෂාව පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම

#### 4.1.2. තරඟ ක්‍රියා පටිපාටිය

1) 6,7,8, 9 ශ්‍රේණි සඳහා තරඟ 4කි.
2) 6, 7 ශ්‍රේණි සඳහා පැය 1යි විනාඩි 30ක් හා 8, 9 ශ්‍රේණි සඳහා පැය 2ක් වන සේ කාලය වෙන්කළ යුතුවේ.
3) එක් එක් ශ්‍රේණියට අදාළ පෙළපොත්වලින් ප්‍රශ්න සකස් කෙරේ. ඊට අමතර ව එදිනෙදා ජීවිතයට අදාළ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ද ඇතුළත් කෙරේ.
4) පළාත් හා සමස්ත ලංකා මට්ටම සඳහා ප්‍රශ්න පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සකස් කෙරේ.

#### 4.1.3. ලකුණු ක්‍රමය

1) මුළු ලකුණු 100කි.

### <u>4.2. කියවීම</u>

#### 4.2.1. අභිමතාර්ථ

1) නිවැරදි උච්චාරණය පුරුදු කිරීම.
2) අවබෝධයෙන් හා අවධානයෙන් යුතු ව කියවීම
3) කියවීමේ හැකියාව හා වේගය වර්ධනය කිරීම
4) ශබ්ද නඟා කියවීම පුරුදු කිරීම
5) හැඟීම් ප්‍රකාශ වන සේ කියවීම වැඩි දියුණු කිරීම

#### 4.2.2. තරඟ ක්‍රියා පටිපාටිය

1) 6,7,8,9, ශ්‍රේණි සඳහා තරඟ ඉසව් 4කි.
2) ශ්‍රේණිය ට අදාළ පෙළපොතින් එක් කොටසක් සහ විනිශ්චය මණ්ඩලය විසින් දෙනු ලබන පුවත්පත්, සඟරා,හෝ වෙනත් පොත් ආදියෙන් තවත් එක් කොටසක් ද ශබ්ද නඟා කියවීම
3) හඬ පාලනය , විරාම ලක්ෂණ, පද බෙදීම ආදිය ගැන සැලකිලිමත් වීම

#### 4.2.3. ලකුණු දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1) | අවබෝධයෙන් කියවීම | - 15 |
| 2) | නිවැරදි උච්චාරණය | - 10 |
| 3) | පැහැදිලි ව ශබ්ද නඟා කියවීම | - 10 |
| 4) | හැඟීම් ප්‍රකාශ වන සේ කියවීම | - 10 |
| 5) | සමස්ත කියවීම | - 05 |
| | මුළු ලකුණු | - 50 |

## 4.3. කථික

### 4.3.1. අභිමතාර්ථ

1) කථන හැකියාව වැඩි දියුණු කිරීම
2) තර්කානුකූලව හා ක්‍රමානුකූලව අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම
3) මාතෘකාවට අදාළ කරුණු නියමිත කාලයන් තුළ ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම
4) පැහැදිලි උච්චාරණය දියුණු කිරීම
5) හඬ පාලනය හා උචිත අංග චලන තුළින් සභාව ආකර්ෂණය කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීම

### 4.3.2. ඇගයීම් ක්‍රියා පටිපාටිය

1) 6,7,8, 9 ශ්‍රේණි සඳහා ඇගයීම් 4කි.
2) ඇමුණුම් අංක 1 හි සඳහන් මාතෘකා අතුරින් කුසපත් ඇදීමෙන් ලැබෙන මාතෘකාව යටතේ කතාව ඉදිරිපත් කල යුතු ය. කුසපත් ඇදීමෙන් ලැබෙන මාතෘකාව යටතේම කථා කළයුතු අතර මාතෘකාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. (මාතෘකා වාර්ෂික ව වෙනස් කරනු ලැබේ.)
3) කාලය විනාඩි 03කි

### 4.3.3. ලකුණු දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1) | මාතෘකාවට අදාළ වීම හා නිර්මාණශීලි බව | - 15 |
| 2) | පැහැදිලි හා නිවැරදි උච්චාරණය | - 10 |
| 3) | කරුණු පැහැදිලිව ඉදිරිපත් කිරීමේ හැකියාව | - 10 |
| 4) | හඬ පාලනය හා උචිත අංග චලනය | - 10 |
| 5) | නියමිත කාලය ප්‍රයෝජනයට ගැනීම හා අවසානය | - 05 |
| 6) | **මුළු ලකුණු** | - 50 |

## 4.4. පද්‍ය ගායනා

### 4.4.1.අභිමතාර්ථ

1) රිද්මයානුකූලව ද, තාලානුකූලව ද, ශ්‍රැතියේ පිහිටා (ශ්‍රවණ මාධූර්යයෙන් යුතුව ) ගැයීමේ හැකියාව නිවැරදි උච්චාරණය, හැඟීම් දැනවීමේ ශක්තිය,සම්ප්‍රදායානුකූල ගායන ශෛලිය හඳුනා ගැනීම.
2) සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම හා හුවමාරු කර ගැනීම

### 4.4.2. ඇගයීම් ක්‍රියා පටිපාටිය

1) එක් පාසලකින් 6 ,7 ,8 ,9 ශ්‍රේණි ඇතුළත් වන පරිදි සිසුන් 8 දෙනෙකුගෙන් යුත් එක් කණ්ඩායමක් පමණක් සහභාගී කළ යුතු ය.මේ සඳහා සිසුන් තෝරා ගැනීමේදී අවම වශයෙන් එක් පංතියකින් සිසුන් දෙදෙනෙකුවත් ඇතුලත් විය යුතුය. පාසල්, කලාප හා පළාත් මට්ටම්වලින් ප්‍රථම ස්ථානය ලබාගත් කණ්ඩායම ම පමණක් ඉදිරි තරග වලට ද ඉදිරිපත් කළ යුතු ය. (කණ්ඩායමේ සාමාජිකයන් වෙනස් කළ නොහැක)
2) වාද්‍ය භාණ්ඩ භාවිතා නොකළ යුතු ය.
3) චක්‍රලේඛයේ ඇමුණුම් අංක 2හි දක්වා ඇති ජන ගායනා අතුරින් 1, 11 හා 111 කොටස් 3 අතුරින් තෝරාගත් කොටස් දෙකකින් එක් කවියක් බැගින් වනසේ කවි 2ක් ද, ඊට අමතර ව ඔබ විසින් තෝරා ගන්නා ලද ජන කවි වර්ගයකින් එක් කවියක් ද වශයෙන් කවි 03ක් තරගය සඳහා ඉදිරිපත් කළ යුතුය. (1, 11 හා 111 හි සඳහන් ජන ගායනා වාර්ෂික ව වෙනස් කරනු ලැබේ.)

I,II, හා III කොටස් යටතට ගැනෙන ජන ගායනා

I. නැලවිලි ගී

II. ජාතික ක්‍රීඩා සම්බන්ධ ගී

III. රැකියා හා බැඳුණු ජන ගී

4) පදය කට පාඩමින් ගායනා කළ යුතු ය.
5) ඒ ඒ පද්‍යයට අයත් විරිත හඳුනා ගෙන ගායනා කළ යුතු ය.
6) මුහුණේ ඉරියව් හැර අංග චලනය විනිශ්චයේ දී සලකා බලනු නොලැබේ.
7) පාසල් නිළ ඇඳුමින් සැරසී ගායනා කළ යුතු ය.

### 4.5.3. ලකුණුදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1) | සම්ප්‍රදායානුකූල නාද රටා - ශ්‍රැති අනුගමනය කිරීම | - 15 |
| 2) | වචනවල නිවැරදි උච්චාරණය | - 15 |
| 3) | කණ්ඩායම් හැඟීමෙන් යුතු ව ගායනා කිරීම | - 10 |
| 4) | මුහුණේ ඉරියව් හැඟීම් දැනවීම හා මතකය | - 10 |
| | මුළු ලකුණු | - 50 |

## 5.0. තරඟ සංවිධාන කටයුතු සඳහා පොදු උපදෙස්

5.1. සෑම පාසලක ම දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතුය . එහි සභාපති ලෙස විදුහල්පති ද ලේකම් ලෙස විෂයභාර ගුරුවරයා ද කමිටු සාමාජිකයින් වශයෙන් සිංහල දෙමළ හා සෞන්දර්ය ගුරුවරු තිදෙනෙකු ද ඇතුළත් විය යුතු ය.

5.2. පාසල් මට්ටමේ තරඟ 6 - 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් සහභාගී කරවා ගෙන පැවැත්විය යුතු ය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්, විෂයභාර ගුරුවරුන් හා දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුව වගකීම දැරිය යුතු වේ.

5.3. තරඟාවලිය සඳහා සහභාගීවන්නන් (එක් තරඟයකට)

5.3.1 පාසල් මට්ටම - 6 – 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සියලුම සිසුන්

5.3.2 කලාප මට්ටම - පාසල් මට්ටමින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.3.3. පළාත් මට්ටම - කලාපවලින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.3.4 සමස්ත ලංකා මට්ටම - පළාත් වලින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.4. පාසල් කලාප පළාත් හා සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන්ට ඒ ඒ මට්ටමේ දී සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කළ යුතු ය.

5.5. මෙම තරඟාවලිය පැවැත්වීමේ දී සියලු ම මට්ටම්වල නිලධාරීන් විසින් විධිමත් ව හා අපක්ෂපාතී ව කටයුතු කිරීමටත් නිසි පරිදි දින වකවානු අනුව තරඟ පවත්වා නිල ප්‍රතිඵල වඩාත් නිවැරිදි ව සහ ප්‍රමාදයකින් තොරව විනිවිද භාවයකින් යුතුව නිකුත් කිරීම සහ ඊට අදාල සියලු තොරතුරු තබා ගැනීම එක් එක් බලධාරීන්ගේ වගකීම වේ.

5.6. මූලික වටයේ සහභාගීවන තරඟකරුවන් වෙනුවට ඊළඟ මට්ටම් වලදී ආදේශ තරඟකරුවන් ඉදිරිපත් කළ නොහැක.

5.7. තරඟ කරුවන්ගේ සම්පූර්ණ නම, උප්පැන්න සහතිකය හා සසඳා නිවැරිදි බවට තහවුරු කර ගත යුතුය.

## ආදර්ශ ආකෘති පත්‍රය

## දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරඟාවලිය

ඉගෙනුම් ලබන මාධ්‍යය :- ..............................................................................................

තරඟයට ඉදිරිපත් වන දෙවන ජාතික භාෂාව: - ..............................................................................

කලාපය / පළාත :- ..............................................................................................

තරඟ වර්ගය (උදා. කථික) :- ..............................................................................................

ශ්‍රේණිය (උදා.6 ශ්‍රේණිය) :- ..............................................................................................

| අනු අංකය | ශිෂ්‍යයාගේ නම (මුල අකුරු සමඟ පැහැදිලි ව) | ස්ථානය | ලබාගත් ලකුණු | පාසලේ නම හා ලිපිනය (තැපැල් ලිපිනය නිවැරදි ව) | පළාත | කලාපය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |

විදුහල්පති / කලාප අ.අ. /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සහතිකය

ඉහත සඳහන් වන්නේ මෙම පාසලේ/කලාපයේ/පළාතේ පවත්වන ලද දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරඟාවලියේ දී ප්‍රථම හා දෙවන ස්ථාන ලබාගත් ජයග්‍රහණය කළ සිසුන් දෙදෙනාගේ සත්‍ය තොරතුරු බව සහතික කරමි.

.......................................................................... ......................................................

විෂයභාර ගුරුභවතා/ විෂයභාර ස.අ.අ/නි.අ.අ.

විදුහල්පති/ක.අ.අ/පළාත් අ.අ

නිල මුද්‍රාව

(මෙම ප්‍රතිඵල වාර්තා කළ යුතු නිල ආකෘති පත්‍රය **නිවැරදි ව සම්පූර්ණ කොට** ඊළඟ තරඟ සඳහා පිටපත් දෙකකින් සකස් කර ඉදිරිපත් කළ යුතුවේ)